පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය - සිංහල
(17.පරාස්ස - නාට්‍ය පිටපත් රචනය)

සතිය-

ශ්‍රේණිය

Prepared by-

- නාට්‍යයක් රඟපෑමට ප්‍රථම එයට අදාළ පිටපතක් රචනා කළ යුතුය.
- පිටපතක් රචනයේදී යම් කතාවක රඟපෑ පෙන්විය හැකි සිද්ධියක් තෝරාගත යුතුය.
- උදාහරණ ලෙස 'එලොව ගිහින් මෙලොව ආවා', 'කදා වළලු', 'නරිබෑණා', 'තොප්පි වෙළෙන්දා','අඹ යහලුවෝ' නාට්‍ය පිටපත් ආපසු කියවා බලන්න.
- නාට්‍ය පිටපත් රචනයේදී සැලකිලිමත් වියයුතු කරුණු කිහිපයකි.
    1. චරිත වම්පස කෙළවර දැක්විය යුතුය.
    2. චරිත නාමයට පසුව තිත් දෙකක් යොදා අනතුරුව සංවාදය ආරම්භ කළ යුතුය.
    3. දෙබස් මගින් නොකිවහැකි වේදිකාවේ ප්‍රදර්ශනය කළයුතු නිර්මාණාත්මක අදහස් ඒ ඒ අදාළ ස්ථානයේ පිටපත තුළ වරහන් ඇතුළත දක්වා තිබිය යුතුය. ඒවා "රංග විධාන" නම් වේ. එය නාට්‍ය පිටපත් රචකයා විසින් නිෂ්පාදකවරයා වෙත නාට්‍ය වඩා සාර්ථක කරගැනීම සඳහා කරන දැනුම් දීමකි.
    4. සම්පූර්ණ කතාවම රඟ දැක්විය නොහැක. නාට්‍යෝචිත අවස්ථා පමණක් තෝරාගත යුතුය.
    5. රසවිඳින්නා කුල්මත්වන ආකාරයෙන් ප්‍රාණවත් දෙබස් ඇතුළත් කළ යුතුය.
    6. උචිත පරිදි කෙටි දෙබස් යොදාගැනීමෙන් චරිතවල ප්‍රාණවත් බව ආරක්ෂා වේ.
    7. නාට්‍යයේ භාෂාව, නළු නිළියන්ගේ අංග චලන, ඇඳුම් පැළඳුම් හා වේදිකා සැරසිලි යෝග්‍ය පරිදි යොදාගත යුතුය.

- මේ ආකාරයට නාට්‍ය පිටපත රචනය සාර්ථක වීමෙන් සාර්ථක නාට්‍යයක් රංගගත කළ හැකිය.

පැවරුම්

1. ඔබ දන්නා ජන කතාවක් ඇසුරෙන් නාට්‍ය පිටපතක් රචනා කරන්න.
2. තවත් නාට්‍ය පිටපත් සොයා කියවා රස විඳින්න.
3. පෙළපොතේ සඳහන් අභ්‍යාස කරන්න.